RARE

# පැරණි ශ්‍රී ලංකාවේ පාලන සංවිධානය සකස්වීම කෙරෙහි භාරතීය රාජ්‍ය පරිපාලන මූලධර්මවල බලපෑම

පී.එම්.යූ. ප්‍රේමරත්න

FGS/03/M.Phil/04/2014/04

දර්ශනපති ඉතිහාසය උපාධිය පූර්ණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

ප්‍රවේශ අංකය: 1295
වර්ග අංකය:

අගෝස්තු 2016

# නිබන්ධ සාරාංශය

**"පැරණි ශ්‍රී ලංකාවේ පාලන සංවිධානය සකස්වීම කෙරෙහි භාරතීය රාජ්‍ය පරිපාලන මූලධර්මවල බලපෑම"** යන මැයෙන් වූ මෙම නිබන්ධය මගින් සාකච්ඡාවට බඳුන් වනුයේ ක්‍රි.පූ. සවන සියවසේ සිදුවූවා යැයි සැලකෙන විජයාගමනයේ සිට සවැනි පරාක්‍රමබාහු රාජ්‍ය කාලය අවසානය දක්වා වූ දීර්ඝ කාල වකවානුව තුළ මෙරට පාලන සංවිධානය කෙරෙහි, මෙරටට ආසන්න ම රාජ්‍යය වූ භාරතයේ පැවති දේශපාලන මූලධර්ම බලපෑවේ ද යන්න යි. මේ අනුව මේ සඳහා ඇති සාධක විභාග කර බැලීම අපගේ පරිශ්‍රමය විය. මෙහිදී උත්තර භාරතීය බලපෑම පිළිබඳ ව විශේෂ අවධානය යොමුවිය.

මෙරට පරිපාලන ක්ෂේත්‍රය සකස්වීම කෙරෙහි උත්තර භාරතීය රාජ්‍ය පාලන මූලධර්ම බලපෑ බව ඇතැම් උගත්තු අදහස් කරති. එමෙන් ම මෙරට පරිපාලන ව්‍යුහයේ ක්‍රියාකාරීත්වය සිදුවූයේ මෙරටට ම ආවේණික ආකාරයෙන් බව තවත් පිරිසකගේ අදහස යි. මේ නිසා මෙම අධ්‍යයනයේදී **පර්යේෂණ ගැටලුව** බවට පත් වූයේ පැරණි ශ්‍රී ලංකාවේ පාලන සංවිධානය සකස්වීම කෙරෙහි උත්තර භාරතීය රාජ්‍ය පරිපාලන මූලධර්ම බලපෑවේ ද නැතහොත් මෙරට පැවතියේ ශ්‍රී ලංකාවට ම ආවේණික වූ පාලන මූලධර්ම ද යන්න යි. එහිදී යොදාගන්නා ලද **ක්‍රමවේදය** වූයේ මූලාශ්‍රය අධ්‍යයනය යි. එනම්, මෙම විෂය සම්බන්ධයෙන් විශේෂයෙන් ම ප්‍රාථමික මූලාශ්‍රයේ දැක්වෙන තොරතුරු සියුම් ලෙස පරීක්ෂා කර බලා ද්විතීයික මූලාශ්‍රය රාශියක් ද සලකා බලමින් මෙම අධ්‍යයනයට අවශ්‍ය දත්ත රැස් කිරීම සිදු කරන ලදී.

පර්යේෂණ ගැටලුව විසඳිය හැකි මාර්ග සෙවීමේ **අරමුණ** පෙරදැරි කොටගෙන එම මූලාශ්‍රය තවදුරට ත් පරීක්ෂණයට භාජනය කිරීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ. එහෙයින් මේ වනතුරු සවිස්තර විමර්ශනයට විෂය නොවී පවත්නා මෙම ක්ෂේත්‍රය සම්බන්ධ තොරතුරු කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමු වේ.

ඒ අනුව මෙරට පාලන සංවිධානය වූ කලී උත්තර භාරතීය දේශපාලන ව්‍යුහයේ ම නොවෙනස් ආකෘතියක් නොවේ. සමස්තයක් වශයෙන් ගත් කල පාලන සංවිධානය කෙරෙහි වූ උත්තර භාරතීය බලපෑම අල්ප වූවක් බව පෙනී යයි. මෙරට රජවරු උත්තර භාරතීය මූලධර්ම ගුරුකොට ගත් අවස්ථාවල්දී ද ඒවා මෙරටට උචිත වන පරිදි සකස් කරගත් බව පෙන්වාදිය හැකි ය. ඒ අනුව මෙරට පැවතියේ මෙරටට ම අනන්‍ය වූ සුවිශේෂ වූ මෙරට බෞද්ධ සංස්කෘතියට සරිලන ආකාරයේ පාලන සංවිධානයක් බව අවසාන වශයෙන් පෙන්වාදිය හැකි ය.

**මුඛ්‍ය පද : මූලධර්ම, පාලන සංවිධානය, පරිපාලන, දේශපාලන, සංස්කෘතිය**

# Abstract

An investigation was carried out for the preparation of the dissertation under the topic of **"Influence of Indian State Administrative Sources towards the formation of Administrative structure of Ancient Sri Lanka".** In order to ascertain as to whether Indian Administrative sources had an influence on the administrative structure of Ancient Sri Lanka being the closest country, for the period from the arrival of King Vijaya up to the end of the period of King Parakramabahu VI in the $6^{th}$ century B.C. Accordingly, the effort of the researcher is to examine the factors related to the above situation.

Certain erudites are of the opinion that the North Indian State Administrative sources had influenced the formation of the Administrative Structure of this country. Opinion of Another group is that the activities of the Administrative Structure of this country was constructed according to the inherited identity of this country. Therefore, the research problem is to investigate into the fact as to whether the formation of the Administrative Structure of this country was influenced by the North Indian State Administrative sources or whether it was organized according to the Administrative sources of inherent identities of Ancient Sri Lanka. The methodology of this reseach is to carry out a study related to the sources of this matter. Collection of data for this study were collected carefully examining the information related to Primary sources while considering about the numerous secondary sources. It is expected to carry out a further examination about the sources with the objective of finding ways and means of arriving at a solutions for the research problem. Special attention of the researcher was paid for this subject which has not been subjected to any investigation so far.

According the Administrative Structure of this country is not a different form of North Indian Political Structure. As such it is seen that the impact of North Indian Administrative Structure towards the Administrative Structure is minimal. Ancient Kings of Sri Lanka had in some instances adapted selected formulas of North Indian Administration with suitable applications. Finally, it could be concluded that our country had exercised an Administrative Structure suitable for the Buddhist culture and a system which was compatible with the inherent identity of this country.

**Key words – Sources, Priciples, Administrative structure, Politics, Culture**